# අකීකරුකමට පාඩමක්



යුවිනි සෙනීෂා විජේවර්ධන

# පිදුම

***පාට හීන අකුරු කරන්න***

***දිරිය දුන්***

***දයාබර ගුරු මව්වරුන්ටත්***

***ආදරණීය***

***අම්මටත්, අප්පච්චිටත්***

***සෙනෙහසින් .....***

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත් වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවයන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම පවරන දරුවාගේ විභවතා හදුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැලපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මඟපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් සැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩ නැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවන්ට ගැලපෙන ලෙස නවීකරණයකරමින් දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සලකා අධ්‍යාපන  අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍යය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියටශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් අදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර
2023-11-01

**මලිති පුංචි ළමයෙක්. එයා ජීවත් වුණේ ලස්සන ගම්මානෙක. හරිම ලොකු කැලෑවකුත් මේ ගමේ තිබුණා.**

**අම්මයි, තාත්තායි වැඩට ගියාම මලිති මුළු දවසම එයාගේ යාළුවා බන්ටිත් එක්ක සෙල්ලම් කළා.**



කැලේ ඉන්න හාවෝ, ලේන්නු, කුරුල්ලොත් මලිතිලා සෙල්ලම් කරන දිහා බලන් ඉන්නවා. හැමදාම හමුවුණ නිසාම කැලේ සත්තු මලිතිගෙත් යාළුවෝ වුණා.

එක දවසක් අම්මයි, තාත්තයි නැති වෙලාවේ මලිති එයාගේ යාළුවන්ට කතා කරත් කවුරුත්ම ආවේ නැහැ. මලිතිට කම්මැලි හිතුණා. ගේ ඇතුළට වෙලා ඉන්න කියලා අම්මා කියලා ගියත් මලිති කළේ කැලෑවට ගිය එක.



ජම්බු ගසේ ජම්බු ඉදිලා. රතුම රතු පාටයි. මලිනි ජම්බු කඩාගෙන කෑවා. එයාගේ සත්තු යාළුවොත් ළඟම හිටියා. මලිනි එයාලවත් දාලා තවත් ඉස්සරහට දිව්වේ පේර ගසක් දැකලා.



හොඳට ඉදුණු පේර ගෙඩියක් කඩා ගත්ත මලිති හැරිලා බලද්දි යාළුවෝ පේන්න හිටියේ නැහැ.

“යාළුවනේ ඔයාලා කොහෙද? ”කියමින් තවත් ඉස්සරහට ගියපු මලිතිට කළුවරක් දැනුණා. එයා හොඳටම බයවෙලා අඩන්න ගත්තා. ඒත් කවුරුත්ම ආවේ නැහැ. මලිති බයෙන් වෙවුලමින් අඬ අඬා ගසකට හේත්තු වුණා. දන්නෙම නැතිව එයාට නින්ද ගියා.



ගෙදර ඇවිත් අම්මයි, තාත්තයි මලිතිව හෙව්වා. එයා පේන්න හිටියේ නැහැ. අම්මයි, තාත්තයි ගමේ අයත් එක්ක හැම තැනම මලිතිව හෙව්වා. කැලෑවටත් ගියා.



“දුවගෙන එන්න, මෙන්න මලිති ඉන්නවා” කව්දෝ කියනවා අම්මට ඇහුණා. අම්මා දුවගෙන යද්දී මලිතිට හොඳටම නින්ද ගිහින් . අම්මා මලිතිව වඩා ගත්තා.



“අනේ අම්මේ මට සමාවෙන්න. ආයේ කවදාවත් මං අම්මා එපා කියන දේ කරන්නේ නැහැ” මලිති කඳුලු සලමින් අම්මයි, තාත්තයි බදාගෙන ඇඬුවා. හැමෝම මලිතිවත් අරන් සතුටින් ගෙදර ගියා.



# ස්තූතිය...

වසර අටක් මා

ගුණ නුවණින්, දිරියෙන්

පෝෂණය කළ

මාගේ ආදරණීය අම්මාටත්, අප්පච්චිටත්

සුරතල් සිනාපාමින් මා අසලම දැවටෙන

මගේ මල්ලියාටත්

සිප් කිරි  පොවා

දිවි මඟ දෙනෙත් පෑදූ

ගුරු මෑණිවරුන්ටත්, ගුරු පියවරුන්ටත් .....

මාගේ හදපිරි ස්තූතිය පුද කරමි.

# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමඟ සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයක් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප් නැංවීම තුළින් රටේ සාහිත්‍යය ප්‍රබෝදයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේදී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩ නැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළගාවීමට නූතන තාක්ෂණය හා බැදුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුලින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැගීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මඟ පෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයන් හා සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කරුවෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට
සෙනවිරත්න මහ ලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කළ ව්‍යාපෘතියේ නිර්මාතෘ
**2023-10-20**